GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2014/04/04

# මාධ්‍ය නිවේදනයයි

**පිනිවා චෝදනා ඇති අවස්ථාවේ මාතෘ සේවාව බිඳ දැමීමට ඇති කුමන්ත්‍රණය එළිදරව් වේ.**

හෙදියන්ට සූතිකා පුහුණුව ලබා දීමට වෛද්‍යවරු ඉන්දියාවෙන් ගෙන්වන බව හෙද සංගමය පවසා ඇත. රටේ නීතියට අනුව හා ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව හෙදියන්ට වින්නඹු සේවාව සැලසිය නොහැක. එබැවින් ඉන්දියාවෙන් ගෙන්වා පුහුණුව ලැබුවද ඉන් හෙදියන්ට පලක් නොවනු ඇත. ඉන් මාතෘ හා ළදරු සේවයටද පලක් නොවනු ඇත. රටට ඵල ලැබෙන්නේ නැත. කෙටියෙන් කිවහොත් අප රටට ඉන් සෙතක් නැත.

කෙසේ නමුත් මෙම ප්‍රශ්නයෙන් අප මෙතෙක් සැක කල කාරණය තහවුරු වී ඇත. යුද්ධය පවතිද්දී පවා අප මාතෘ හා ළදරු සෞඛ්‍ය දර්ශක ඉතා ඉහල අගයක පවත්වා ගියෙමු. අප ජන කොටස් වලට අසමාන අයුරින් සලකන බව චොදනා කිරීමට උත්සාහගත් රාජ්‍ය විරෝධී ජාත්‍යන්තර සංවිධාන වලට එය ඔප්පු කිරීමට අපහසු වූයේ මාතෘ හා ළදරු දර්ශක ඉතා ප්‍රශස්ත මට්ටමක පවත්වා ගත් නිසාය. මේ වන විට නැවත වරක් රජයට පිනීවා චෝදනා එල්ල වී ඇති අවස්ථාවක ස්ථාවරව පවතින මාතෘ හා ළදරු සේවාව අවුල් කිරීමට විවිධ සංවිධාන උත්සාහ කරන බව පෙනේ. එබැවින් ඉහත ප්‍රකාශයෙන් හෙද සංගම් එවැනි රාජ්‍ය විරෝධී කටයුතු වලට සම්බන්ධ බව තහවුරු කර ඇත. එබැවින් රටට සෙතක් ඇතත් නැතත් මෙවැනි පියවරකින් පල ලබන්නෝ කවරෙක්දැයි ඉතා මැනවින් පෙනේ.

හෙදියන්ට සූතිකාගාර පුහුණුව ලබා දීම.

- ජාත්‍යන්තර ප්‍රමිතියට විරුද්ධය.
- ස්ථාවරව පැවති ලංකාවේ මාතෘ හා ළදරු සේවාවට විරුද්ධය.
- ජාත්‍යන්තර ප්‍රමිතිය ගරු කරන එමෙන්ම මේ සම්බන්ධව වගකීම දරන ප්‍රසව හා නාරිවේද වෛද්‍යවරුන්ගේ ස්ථාවරයට සම්පූර්ණ විරුද්ධය.
- ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන්ගේ ස්ථාවරයටද විරුද්ධය.
- වින්නඹු සේවාවේ පුහුණු වියදම 03 ගුණයකින් ඉහල යනු ඇත.
- මේ කරුණු කෙසේ වෙතත් රටේ නීතියට විරුද්ධය (වෛද්‍ය ආඥා පනත අනුව).
- හෙද හිඟය තවදුරටත් වැඩි වනු ඇත.
- වින්නඹු සේවාව තුල අනවශ්‍ය ගැටුමක් නිර්මාණය වනු ඇත.
- හෙදියන්ට ඉන් ඵලක් නොවන අතර අපකීර්තියට ලක් වනු ඇත.

මේ සිද්ධිය සම්බන්ධව විස්තරාත්මක වාර්තාවක් අමුණා ඇත.

ස්තුතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර සඳහා : වෛද්‍ය නවීන් සොයිසා - 0718582444
වෛද්‍ය නලින්ද හේරත් - 0717876516